# රැකියා පුරප්පාඩු

## ප්‍රධාන විධායක නිලධාරී තනතුර

## සී/ස කුරුණෑගල වැවිලි සමාගම

## (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය)

ශ්‍රී ලංකාවේ වැවිලි අංශයේ ප්‍රමුඛතම රජය සතු ව්‍යවසායයක් වන සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා දූරදර්ශී, කාර්යශූර හා දක්ෂ වෘත්තිකයෙකු අවශ්‍ය වී ඇත.

ප්‍රධාන විධායක නිලධාරී ලෙස තෝරා ගනු ලබන අපේක්ෂකයා සමාගමේ තිරසාර වර්ධනය සහ ලාභදායීත්වය සහතික කිරීම සඳහා උපායමාර්ගික මඟ පෙන්වීම, ඵලදායී නායකත්වය සහ මනා කළමනාකරණයක් සැපයීම සඳහා වගකීමට බැඳී සිටියි.

**<u>ප්‍රධාන වගකීම්</u>**

- සමාගමේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා දූරදර්ශී නායකත්වයක් ලබා දීම සහ දිගුකාලීන උපාය මාර්ගික සැලසුම් සකස් කිරීම
- සමාගමේ සියලුම මෙහෙයුම් හා මූල්‍ය කටයුතු අධීක්ෂණය කිරීම
- කුරුණෑගල වැවිලි සමාගම විසින් කළමනාකරණය කරනු ලබන පොල්, රබර්, තේ ඇතුළු අනෙකුත් වැවිලි බෝග, කෘෂිකාර්මික හා කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම්වල තිරසාරභාවය සහ ඵලදායීතාවය සහතික කිරීම
- නවෝත්පාදනය, විනිවිදභාවය සහ යහපාලනය පිළිබඳ සංස්කෘතිය පෝෂණය කිරීම.

**<u>සුදුසුකම් හා පළපුරුද්ද</u>**

- පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය/විද්‍යාව/ව්‍යාපාර කළමනාකරණය හෝ ඒ හා සමාන උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් සම්පූර්ණ කර තිබීම

සහ

පිළිගත් ආයතනයක (වැවිලි/කෘෂි ව්‍යාපාරයක විශේෂයි) විධායක ශ්‍රේණියේ වසර 18 කට නොඅඩු පළපුරුද්ද හා ඉන් වසර 05 ක් ඉහල කළමනාකරණ මට්ටමේ පළපුරුද්ද

සමඟ

- පොල් නිෂ්පාදනය, සැකසීම සහ පොල් වතු කළමනාකරණය පිළිබඳ නිපුණතාවය
- මානව සහ අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකරණය කිරීමට ඇති හැකියාව
- උපායමාර්ගික සැලසුම්කරණය, මූල්‍ය කළමනාකරණය සහ සංවිධානාත්මක නායකත්වය

**<u>වයස</u>**

වයස අවුරුදු 35 නොඅඩු සහ 55 නොවැඩි විය යුතුය. මෙම ඉහල වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා බල නොපානු ඇත.

**<u>වැටුප්</u>**

තෝරගනු ලබන අයදුම්කරු පහත වැටුප් ව්‍යුහය යටතේ සේවයට අනුයුක්ත කරනු ඇත.

HM - 2 - 1 - 2025 රු.161,140 - 12 X 4,850 ÷ 219,340 (මීට අමතරව ජීවන වියදම් දීමනාව සඳහාද තෝරාගනු ලබන අයදුම්කරු හිමිකම් ලබනු ඇත.)

**<u>අනිකුත් පහසුකම්</u>**

තෝරාගනු ලබන අයදුම්කරු සඳහා පුද්ගලික ධාවනයද සහිතව ආයතනය මඟින් නඩත්තු කරන නිල රථයක්, ගෘහභාණ්ඩ සහිතව නිල නිවසක්, කම්කරු දීමනා 4 ක් (ඉන් 3 ක් මුදල් බවට පත් කල හැක) හා ආයතනය විසින් සම්පූර්ණයෙන්ම දායකවන රෝහල් ගත වීමේ රක්ෂණාවරණයක්, වාර්ෂික ප්‍රසාද දීමනා සහ කාර්ය සාධනය මත පදනම් වූ දිරි දීමනා හා තනතුරට අදාල අනෙකුත් වරප්‍රසාද සඳහා හිමිකම් ලබනු ඇත.

අයදුම්කරු ගැන විමසීම් කලහැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා දුරකථන අංක අයදුම්පතෙහි සඳහන් කර අදාල සහතිකවල පිටපත්ද සමඟ "සී/ස කුරුණෑගල වැවිලි සමාගමේ ප්‍රධාන විධායක නිලධාරී තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යනුවෙන් ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ පැහැදිලිව සඳහන් කර පහත ලිපිනයට 2025.09.01 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය ආයතනල දෙපාර්තුමේන්තු හෝ මණ්ඩල වල සේවයේ නියුක්ත වුවන් මේ සදහා අයදුම් කරන්නේනම් අදාල ආයතන ප්‍රධානියාගේ අනුමැතිය සහිතව අයදුම් කළ යුතුය. සෘජුව තාවකාලික අයදුම්පතක් (Advance Copy) යොමු කල හැකිය.

**බඳවා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම නුසුදුසුකමක් සේ සැලකීමට හේතුවක් වනු ඇත.**

මානව සම්පත් හා පරිපාලන කළමනාකරු,
සී/ස කුරුණෑගල වැවිලි සමාගම,
නො.80,
දඹුල්ල පාර,
කුරුණෑගල.
දු.ක - 037 2223133
2025.08.17